**විසල් ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - 2015**

-----------------------------------------------------------------------------------

විසල් ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ එජන්සි ෆ්‍රාන්ෂයිස් ඩී ඩිවලොප්මන්ට් අතර 2005 ඔක්තෝබර් 05 දින එළඹි අංක සීඑල්කේ 3000 01 එච් දරන ණය ගිවිසුමේ II වගන්තියේ 8 ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

විසල් ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කන්තලේ, තම්පලකාමම්, කින්නියා, ත්‍රිකුණාමලය නගරය හා කඩවත් සතර සහ කුච්චවේලී උතුර යන ප්‍රදේශවල දැනට පවත්නා 17,000 ක මට්ටමේ සිට සැපයුම් සම්බන්ධතා සංඛ්‍යාව 61,500 ක් දක්වා වැඩි කිරීම මඟින් ආරක්ෂිත පානීය ජලය සැපයීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 5,654.25 කට සමාන යූරෝ මිලියන 37.08 ක් වන අතර, ඉන් රු.මිලියන 1,500.75 කට සමාන යූරෝ මිලියන 10.35 ක් සහ රු.මිලියන 2,062.50 කට සමාන යූරෝ මිලියන 12.5 ක් මූල්‍යායනය කිරීමට පිළිවෙලින් ඒජන්සි ෆ්‍රාන්ෂයිස් ඩි ඩිවොලප්මන්ට් ඔෆ් ෆ්‍රාන්ස් හා රිසර්ව් පේස් ඉමර්ජන්ට්ස් - ෆ්‍රෙන්ච් ප්‍රොටෝකෝල් (**Reserve Pays Emergents French Protocol**) එකඟ වී තිබුණි. ඉතිරි ශේෂය වූ රු.මිලියන 2,091 කට සමාන යූරෝ මිලියන 14.23 ශ්‍රී ලංකා රජය දායක වීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2006 පෙබරවාරි මාසයේදී ආරම්භ කර තිබූ අතර 2010 නොවැම්බර් 30 වන විට නිම කිරීමට ආරම්භකව සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2015 අගෝස්තු 31 දක්වා අවස්ථා 03 කදී දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.

තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂයන්, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලමබැ) ගිණුම් වාර්තා සමහ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

මිල ගණන් ඇගයීම අවධියේ කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාදුන් රු.මිලියන 5.15 ක් අගය වූ වාණිජ වට්ටම් ව්‍යාපෘති ගිණුම්කරණ ක්‍රියාවලිය සඳහා සලකා බලා නොතිබුණු අතර එම මුදල මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු මුදලක් ලෙස වැරදියට පෙන්වා දී තිබුණි.

## 2.2.2 නොසැසඳූ ශේෂ

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තොරතුරුවලට අනුව වර්ෂය තුල යූරෝ 719,044 කට සමාන රු.මිලියන 105.47 ක මුදලක් මුදාහැර තිබුණි. එසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, අදාල මුදල යූරෝ 713,718 කට සමාන රු.මිලියන 109.69 ක් ලෙස පෙන්වා දී තිබූ අතර, වෙනස වූ යූරෝ 5,326 කට සමාන රු.මිලියන 4.22 ක මුදල සසඳා නොතිබුණි.
තවද, 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සම්පූර්ණ මුදා හල මුදල යූරෝ මිලියන 11.83 කට සමාන රු.මිලියන 1,903.22 ක් ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තු වාර්තාවල දක්වා තිබුණු අතර අදාල මුදල ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා දී තිබූ යූරෝ මිලියන 11.58 කට සමාන රු.මිලියන 1,887.74 ක මුදල සමඟ එකඟ වී නොතිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 4,188.49 ක් විය. කෙසේ වුවද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, එය රු.මිලියන 4,965.69 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 21.64 ක් වේ. කෙසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශනය අනුව අදාල මුදල රු.මිලියන 20.66 ක් විය.

## 2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

2002 අංක 14 දරන එකතු කළ අගය මත ලද බදු පනත මගින් සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූල නොවන ලෙස, 2013 වර්ෂයේ සිට මේ දක්වා එකතු කළ අගය මත බදු සමුච්චිත මුදල වූ රු.මිලියන 21.34 ක මුදල කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා නොතිබුණු බව නිරීක්ෂණය විය.

# 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------------

## 3.1 අරමුදල් උපයෝජනය

--------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණයගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරිම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | යූරෝ මිලියන | රු.මිලියන | රු.මිලියන | යූරෝ මිලියන | රු.මිලියන | යූරෝ මිලියන | රු.මිලියන |
| ඒඑෆ්ඩී | 10.35 | 1,500.75 | - | - | - | 10.14 | 1,637.07 |
| ආර්පීර් | 12.50 | 2,062.50 | - | 0.68 | 109.70 | 11.70 | 1,887.74 |
| ශ්‍රීලංර | 14.23 | 2,091.00 | 71.28 | 0.50 | 81.47 | 9.58 | 1,547.07 |
| එකතුව | 37.08 | 5,654.25 | 71.28 | 1.18 | 191.17 | 31.42 | 5,071.88 |

### 3.2 භෞතික කාර්යසාධනය

විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව, තුළු මග (intakes) ඉදිකිරීම්, පොම්පාගාර ඉදිකිරීම්, ජලාශ ප්‍රතිසංස්කරණය කිරීම, ජලනළ එළිම සහ අනෙකුත් සේවාවන් සඳහා ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත් 26 ක් ප්‍රදානය කර තිබුණි. මේ අතරින් ඉහත සඳහන් කළ කාර්යයන් ඉටුකිරීම සඳහා පවරන ලද කොන්ත්‍රාත් 24 ක වැඩ මාස 12 සිට මාස 54 ක් දක්වා ප්‍රමාදයන් සහිතව 2014 දෙසැම්බර් 31 දිනට වැඩ නිම කර තිබුණි. ජලනල එළීම සඳහා ඉතිරිව තිබූ වැඩ නියමිත දිනට මාස 19 කට අධික ප්‍රමාදයක් සහිතව 2015 දෙසැම්බර් 31 දින වැඩ අවසන් කර තිබුණි. දැනට පවතින ආරක්ෂිත පානීය ජල සැපයුම් සම්බන්ධතාවය 17,000 සිට 61,500 ක් දක්වා වැඩි කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාව අනුව, 2015 දෙසැම්බර් 31 දිනට ජල සැපයුම් සම්බන්ධතා 47,759 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

### 3.3 මතභේදයට තුඩුදෙන කරුණු

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වෙන්කරන ලද අරමුදල් අඩුකම නිසා, පුල්මුඩේ හා ඒවාලම්පත්තු ජල සැපයුම් යෝජනාක්‍රම ඉදිකිරීම් වැඩ අත්හැර දමා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ජල විද්‍යාත්මක අධ්‍යයනය හා ශක්‍යතා අධ්‍යයනය වෙනුවෙන් උපදේශනාත්මක සේවා ලබාගැනීම වෙනුවෙන් දරන ලද පිළිවෙලින් යූරෝ 55,622 ක් හා යූරෝ 85,632 ක මුදල ප්‍රතිඵල රහිත විය.

(ආ) ව්‍යාපෘති අවසන් වාර්තාවේ නිර්දේශ කර ඇති පරිදි ජල සැකසුම් පිරියනයෙන් එකෙන් ඉවත් කරනු ලබන රොන් මඩ සඳහා රොන් මඩ වියලි කරන beds ඉදිකිරීම සඳහා වහාම පියවර ගත යුතුව ඇත. කෙසේ වුවද, ව්‍යාපෘති නියෝජිතායතනය විසින් ජල සැපයුම් පහසුකම් ලබාගැනීමට අදහස් කළ පාර්ශවයන්ට එම පහසුකම් ලබා දීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 3.4 බාහිර ක්‍රියාකාරකම්

-----------------------

2015 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් රු.මිලියන 88 ක් වටිනා ද්‍රව්‍ය ව්‍යාපෘතිය විසින් මිලදී ගෙන තිබුණි.

## 3.5 පෙර විගණන මගින් ඉස්මතු කළ නිරාකරණය නොකළ කරුණු

--------------------------------------------------------------------------

2005 අංක 05 දරන මුදල් පනතේ 03 වන ඡේදයේ විස්තර කර ඇති පරිදි කොන්ත්‍රාත් ගෙවීම්වලින් සියයට 01 ක් ඉදිකිරීම් කර්මාන්ත සුරැකුම් අරමුදල් බදු ලෙස දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණද 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ගෙවා තිබූ මුළු කොන්ත්‍රාත් ගෙවීම් මුදල වූ රු.මිලියන 21.5 ක මුදලින් එම බදු අඩුකර ප්‍රේෂණය කර නොතිබුණි.

## 3.6 මූල්‍ය පාලන දුර්වලතා

----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 133 හා 2010 ජූලි 26 දිනැති අංක 05 දරන විගණන කළමනාකරණ චක්‍රලේඛය අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ව්‍යාපෘතියේ කාර්යයන් විගණනය කර නොතිබුණි.

(ආ) උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයේ තැන්පත් කර තිබූ ආපසු ගෙවනු ලබන රු.මිලියන 04 ක මුදල 2016 දෙසැම්බර් 31 දින වන විටත් ආපසු ලබාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. අදාල කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු වගකීම් කාලය 2014 ඔක්තෝබර් 03 දින කල් ඉකුත් වී තිබූ අතර ව්‍යාපෘති වැඩ අවසන් සහතිකයද නිකුත් කර තිබුණි.